## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ජනාධිපති ලේකම්තුමා,

අග්‍රාමාත්‍ය ලේකම්තුමා,

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු,

පළාත් සභා ප්‍රධාන ලේකම්වරු,

**ජනාධිපතිවරණ ඡන්ද විමසීම 2019**

**රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ක්‍රියාත්මකවීම පිළිබඳ නියමයන්**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 ව්‍යවස්ථාව අනුව ජනරජයෙන් වැටුප් ලබන නිලධාරීන් "රාජ්‍ය නිලධාරීන්" ලෙස අර්ථකථනය කර ඇත. එය දණ්ඩ නීති සංග්‍රහයේ 19 වන වගන්තිය තුළින් ද වැඩිදුරටත් පැහැදිලි කෙරේ. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව ප්‍රකාර සියලුම රාජ්‍ය නිලධාරීන් ව්‍යවස්ථාවේ ඇතුලත්කර ඇති මානව හිමිකම්වලට ගරු කිරීමට හා ආරක්ෂා කිරීමට බැඳී සිටී. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වන සංශෝධනය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථවට අනුකූලව කටයුතු කරන බවට සියලුම රාජ්‍ය නිලධාරීන් දිවුරුම් දී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව අනුව සියලුදෙනාම නීතිය ඉදිරියේ සමාන වන අතර නීතිය ක්‍රියාත්මකවීම හා නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතු ය.

ඡන්දය දැමීමට ඇති අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තහවුරු කර ඇත. මේ අනුව ඡන්ද විමසුමක් පවත්වන අවස්ථාවක, පවත්නා මැතිවරණය රටේ පවතින අනෙකුත් නීති හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීමට රාජ්‍ය නිලධාරීන් බැඳී සිටින අතර, ඒ ඒ වගකීම් දරණ රාජ්‍ය නිලධාරීන් විසින් එකී නීතිවලට අනුකූලව සාධාරණ හා අපක්ෂපාතීව තම රාජකාරී කටයුතු ක්‍රියාත්මක කළ යුතුව ඇත.

රාජ්‍ය නිලධාරීන් බැඳී සිටින නිතිමය වගකීමක් අයුතු ලෙස යොදාගැනීම හෝ නීතිමය සීමාව ඉක්මවා ක්‍රියාකිරීම මෙන්ම කළ යුතු කාර්යයන් නොකර සිටීම ද , සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හැරීම ද , අනවශ්‍ය ලෙස ප්‍රමාද කිරීම ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වේ. ඒ අනුව රාජ්‍ය නිලධාරීන් විසින් එවැනි මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කළ අවස්ථාවලදී ඔවුන්ට විරුද්ධව

විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීමට සහ ඔවුන් සම්බන්ධව කටයුතු කිරීමට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත බලතල හිමි වේ.

මේ අනුව කොමිෂන් සභාව විසින් මෙම මැතිවරණ වකවානුවේ නිදහස් හා සාධාරණ මැතිවරණයක් පවත්වාගෙන යාම වෙනුවෙන් රාජ්‍ය නිලධාරීන් තම වගකීම නිසි ලෙස ඉටුකරන්නේ ද යන්න අධීක්ෂණයට ලක්කරනු ඇත.

එබැවින් පහත සඳහන් පරිදි ක්‍රියාකරන ලෙසට ඔබ ඇතුලු ඔබ පාලනය යටතේ පවතින ආයතනවල කාර්ය මණ්ඩලයන්ට දැනුම් දෙන ලෙස හා දැනුවත් කරන ලෙස මෙයින් දන්වා සිටිමු.

- නීතිය අපක්ෂපාතීව හා සාධාරණව ක්‍රියාත්මක කළ යුතුය

- නීතිය ක්‍රියාත්මක නොකිරීම, එක් පාර්ශවයකට වාසි සහගත වන අයුරින් බලය අයුතු ලෙස භාවිතා කිරීම (උදා :- මැතිවරණ නීති උල්ලංඝනය කරමින් සමහර දේශපාලන පක්ෂවලට/කණ්ඩායම් වෙත පොදු දේපල සහ සම්පත් භාවිතා කිරීමට ඉඩ ප්‍රස්ථා ලබාදීම) මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් වේ. රජයේ වගකීමට අමතරව, නීතිය ක්‍රියාත්මක නොකිරීම හා නීතිය නොසළකා සිටීම මඟින් සිදුවන හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ එම නිලධාරීන් පෞද්ගලිකවම වගකීම් දැරිය යුතුය.

මෙම දැන්වීම කරනුයේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව බව සලකන්න.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

ආචාර්ය දීපිකා උඩගම,

සභාපතිනී,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2019 ඔක්තෝම්බර් 15